**සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල - 2025**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අදාල කාර්ය නිම කල විගසම අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවද, 2024 වර්ෂයේදී විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් රු.50,130ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. | 2024 වර්ෂයට අදාල රු. 50,130 න් රු. 23,180 ක් දොපර්තමේන්තුවේ ඒකාබද්ධ අරමුදලට සහ රු. 26,950 ක් වැටුප් ගිණුමටත් එවා ඇත. කෙසේ වෙතත් මෙම මුදල් අත්තිකාරම් පියවීම සඳහා සමාජ සංවර්ධන අරමුදලට ලැබී නොමැති බැවින් තවදුරටත් ලැබිය යුතු අත්තිකාරම් මුදලක් ලෙස සටහන් කර ඇති බව සඳහන් කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් නොපියවන නිලධාරීන් සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනිමටත්, ඉදිරියේදී මෙවැනි තත්වයන් සිදු නොවීමටත් වගබලා ගත යුතුය. |

### 1.5.2 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 381 (1) | 2017 වර්ෂයේ සිට අරමුදල සඳහා ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණ ද මෙම වාර්තාවේ දිනය දක්වාම ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ජංගම ගිණුම සඳහා අනුමැතිය ලබා නොගැනීමට හේතු සොයා බැලීමටත්, අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබා ගැනීමටත් කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 877 (1) (ඇ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනිම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අයවැය ලේඛන සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දී ඇත. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම පිළිබඳ පසු විපරම් නොකිරීම නිසා මෙම තත්වය ඇති වී ඇත. | අමාත්‍යාංශයෙන් අනුමත වූ අයවැය ලේඛනය චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය වෙත යොමු නොකිරිමට හේතු සොයා බැලිය යුතු අතර, ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට වගබලා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,832,924 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,571,739 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,738,815 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.5,719,230 ක ප්‍රජා හරසර උත්සව වියදම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන කොඩි අලෙවියෙන් 2023, 2024 හා 2025 වර්ෂවලදී පිළිවෙලින් රු. 23,077,572ක්, රු.16,972,559ක් හා රු.15,731,926ක් ආදායම් උපයා තිබූ අතර, ඒ අනුව කොඩි අලෙවි ආදායම අඛණ්ඩව පහළ යමින් පැවතීම අරමුදලේ මූල්‍ය ස්ථාවරත්වයට අහිතකර ලෙස බලපාන තත්ත්වයක් පැවතුණි. | 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ කොඩි ආදායම් අඩු වූ ප්‍රමාණය සතුටුදායක තත්වයකින් ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබී ඇත. 2026 දී වර්ෂයේ කොඩි ආදායම තවදුරටත් ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග හඳුනා ගනිමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එමඟින් අරමුදල වැඩි කර ගැනීමේ අභියෝගය සාර්ථක කර ගත හැකි බව විශ්වාස කරමි. | ප්‍රධාන ආදායම අඛණ්ඩව පහළ යාමට හේතු හඳුනාගෙන, ආදායම ඉහළ නැංවීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනය වන මැයි 31 දිනට සමගාමීව සමෘද්ධි ප්‍රතිලාභීන්ට හා ප්‍රජාව වෙත කොඩි හා ස්ටිකර් අලෙවි කිරිම මඟින් ලැබෙන ආදායමෙන් සියයට 10 ක් අරමුදලට බැර කරන අතර ආදායමෙන් සියයට 90 ක | සමස්ථ කොඩි ආදායමින් සමාජ සංවර්ධන අරමුදලට බැර කර ඇති සියයට 10 ක මුදල රු.මි.15.73 කි. කොඩි ආදායමින් සියයට 90 ක් වූ ඉතිරි මුදල වන රු.මි. 141.59 න් ඒ ඒ ප්‍රජාමූල සංවිධාන විසින් තමන් සතු මුදල් ප්‍රමාණය මත ව්‍යාපෘති | කොඩි ආදායම අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඵලදායීව උපයෝජනය කිරීමටත්, ඒ සම්බන්ධයෙන් නිරන්තර පසුවිපරම් කටයුතු සිදු කිරීමටත් කටයුතු කළ යුතුය. තවද, කොඩි අලෙවි |

| | | | |
|---|---|---|---|
| | උපරිමයකට යටත්ව අනුමත ව්‍යාපෘති සඳහා මුදල් වැයකල යුතු වේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී කොඩි වැඩසටහනෙන් ලැබූ රු.157,319,268 ක්වූ මුළු ආදායමෙන් සියයට 10ක් එනම් රු.15,731,926 ක් අරමුදලට බැර කර තිබූ අතර, ඉතිරි සියයට 90 ක්වූ රු.141,587,341 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණේ රු.78.529,480 ක් පමණි. ඒ අනුව, රු.63,057,861 ක මුදලක් තවදුරටත් ඉතිරිව පැවති අතර, එම මුදල් ඵලදායීව උපයෝජනය කිරීම පිළිබඳව කළමනාකරණය විසින් ප්‍රමාණවත් පසු විපරමක් සිදුකර නොතිබුණි. තවද, කොඩිවල නිශ්චිත වටිනාකම සඳහන් කර නොතිබීම හේතුවෙන් කොඩි අලෙවි ආදායමේ සම්පූර්ණත්වය හා නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රමවේදයක් පවත්වා නොතිබුණි. | ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව පොදුවේ හඳුනා ගත හැකි වැඩසටහන් 7කට සහ වෙනත් වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව සමස්ථ වැඩසටහන් සඳහා වැය කර ඇති මුදල රු.මි. 78.53 කි. තවද ඉතිරි මුදල යොදා ගනිමින් ඊලඟ කොඩි දිනය වන තෙක් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව කොඩි ආදායමට අනුව හැකි උපරිම අයුරින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.<br>කොඩියක වටිනාකම නිශ්චිතව සඳහන් නොකිරීමට හේතු වන්නේ විවිධ මට්ටමින් ප්‍රජාව ආධාර ලබාදීම තුළින් රැස්වන ආදායම කොඩියේ මිල සඳහන් කිරීම මත සීමා වීමට ඉඩ ඇති නිසාවෙනි. | ආදායමේ සම්පූර්ණත්වය හා නිරවද්‍යතාව තහවුරු වන පරිදි කොඩි නිකුත් කිරීම, අලෙවිය හා ආදායම් එකතු කිරීම සම්බන්ධ විධිමත් පාලන හා වාර්තාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | අරමුදලේ ව්‍යවස්ථාව සඳහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබාගෙන නොතිබූ අතර, අරමුදලෙන් සිදු කළ හැකි ගෙවීම් හා අරමුදල් භාවිතය පිළිබඳ විධිවිධාන ද ව්‍යවස්ථාවට ඇතුළත් කර නොතිබුණි. | අරමුදලේ ව්‍යවස්ථාව සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර නොමැති අතර, සමෘද්ධි ජාතික සභාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පමණක් සිදු කර ඇත. | අරමුදලේ ව්‍යවස්ථාව, අදාළ විධිවිධාන ඇතුළත් වන පරිදි විධිමත්ව සකස් කර, භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය තේමා කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන කොඩි වැඩසටහන් මඟින් එකතු කරනු ලබන මුදලින් සියයට 90 ක් අදාළ ප්‍රාදේශීය සංවිධානවල ගිණුම් සඳහා වෙන් කරනු ලබන අතර, ඉතිරි සියයට 10 ක් අරමුදල වෙත බැර කරනු ලබන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම සියයට 10 ක දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන අරමුදලේ අරමුණු හා කාර්යයන් අරමුදලේ ව්‍යවස්ථාව තුළ පැහැදිලිව හා වෙනම හඳුනාගත හැකි පරිදි දක්වා නොතිබුණි. තවද, එම අරමුණු හා කාර්යයන්ට | දෙපාර්තමේන්තුව සතු අරමුදල් යාවත්කාලීන කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කර ඇති කමිටු වාර්තා නිර්දේශ හා මඟ පෙන්වීම අනුව සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ ව්‍යවස්ථාව සියයට 10 ක් සහ සියයට 90 ක් සඳහා වෙන වෙනම අරමුණු කාර්යයන් ඇතුළත් කර සංශෝධනය කිරීමට කටයුතු සැලසුම් කර ඇත. | සියයට 10 ක දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන අරමුදලේ අරමුණු හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කර, ඒවා අරමුදලේ ව්‍යවස්ථාවට ඇතුළත් වන පරිදි ව්‍යවස්ථාව විධිමත්ව සංශෝධනය කළ යුතුය. තවද, එම අරමුණු හා කාර්යයන්ට අනුකූලව අරමුදලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පාලන හා පරිපාලන විධිවිධාන ස්ථාපිත කර, එම කටයුතු විධිමත්ව අධීක්ෂණය කිරීම තහවුරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුකූලව අරමුදලේ මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පාලන හා පරිපාලන විධිවිධාන ප්‍රමාණවත් ලෙස ස්ථාපිත කර නොතිබුණි. | | |
| (ඉ) | 2025 සැප්තැම්බර් 04 දිනැති අංක අමප/25/1531/804/179 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කරන ලද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද අරමුදල් සමාලෝචන කමිටුවේ 2025 ජූලි 02 දිනැති වාර්තාවේ 6 වන ඡේදය ප්‍රකාරව, මෙම අරමුදල නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කළ යුතු අරමුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන තිබුණද, එම උපදෙස් අනුව අරමුදලේ අනාගත පැවැත්ම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග හා ඊට අදාළ නෛතික කටයුතු මෙම වාර්තාවේ දිනය වන විටත් අවසන් කර නොතිබුණි. | නීතිපතිගෙන් විමසා අදාළ තීරණය ලැබී ඇති අතර මේ පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. දෙපාර්තමේන්තුවේ මෙම කටයුතු විධිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටුවේ සාකච්ඡා වූ පරිදි පත්කරන ලද විශේෂ කමිටු මඟින් මෙම අරමුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ලැබේ. | 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව අදාළ කටයුතු සඳහා ලබා දී ඇති කාලසීමාව අවසන් වී ඇති බැවින්, නීතිපතිවරයාගේ උපදෙස් හා අදාළ නීතිමය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම අරමුදල සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 178 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ 2009 මාර්තු 16 දිනැති මාණ්ඩලික පත්‍රිකා අංක 05/2009 මඟින් අනුමත කරන ලද අරමුදලේ නව ව්‍යවස්ථාවේ සඳහන් අරමුණු 16 අතුරින් අරමුණු 10 ක් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අවශ්‍ය අවධානය යොමු කර නොතිබුණි. | එක් එක් ප්‍රජාමූල සහ ප්‍රාදේශීය සංවිධාන විසින් සඳහන් කර ඇති අරමුණු 16 ඇතුළත් වන සේ අවශ්‍යතාවය සහ ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘතින් තෝරා ගැනීම සහ අනුමැතිය ලබාදීම හා ක්‍රියාත්මක කිරීම ඒ ඒ ප්‍රජාමූල සංවිධානවල විධායක සභාව විසින් සිදු කරනු ලබයි. අරමුදලෙහි පවතින මුදල් ප්‍රමාණය, සාමාජිකයින්ගේ ඉල්ලීම්, ව්‍යාපෘති ඵලදායීතාවය අනුව ද ඒ ඒ ප්‍රදේශ අනුව ද | අරමුදලේ ව්‍යවස්ථාවේ සඳහන් සියලු අරමුණු ආවරණය වන පරිදි අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය හඳුනාගෙන ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වෙනස් වන බැවින් මෙම තත්ත්වය දිස්ත්‍රික් හෝ සංවිධාන ලෙස අරමුණු සියල්ල සපුරාලිය හැකි වන සේ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම සිදු නොවිය හැක. එහෙත් සමස්ථ දිවයින තුළම ක්‍රියාත්මක වූ වැඩසටහන් මඟින් මෙම අරමුණු බොහෝමයක් ඉටු කර ඇති බව සඳහන් කරමි. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ 2025 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදලේ අරමුණු ඉටු කිරීම සඳහා වැඩසටහන්/ක්‍රියාකාරකම් 12ක් වෙනුවෙන් රු. 56,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා රු. 29,100,000 ක් පමණක් වැය කර තිබූ අතර, එය වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 52ක් පමණක් විය. ඒ අනුව, අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව වෙන් කළ ප්‍රතිපාදනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | අනුමත සැලැස්මේ ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විධිමත් මුලාය කළමනාකරණයක් සහ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලි අනුගමනය කිරීම තුළින් ව්‍යාපෘති සඳහා වෙන් කළ මුදලින් දරන ලද වියදම් අඩු කළ පසු ඉතිරි වූ මුදල් ශේෂ ද බලපා තිබුණි. | අරමුදලේ කාර්යයන් ඉටු කිරීම සඳහා යථාර්ථවාදීව ප්‍රතිපාදන වෙන් කර, වෙන් කළ අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |